


# රැකියාව ගැන ජන්ම පතින්

කේන්ද්‍රයක දසවැන්න රක්ෂාව පිළිබඳ සොයා බලන ස්ථානය ලෙස සරළව හඳුන්වයි. ප්‍රධාන වශයෙන් දසවැන්න රැකියාව පිළිබඳ සොයා බලන ස්ථානය වුවත් රාශී 12න් තවත් කරුණු රාශියක් දසවැන්න කෙරේ බලපාන ආකාරයද සැළකිල්ලට ගත යුතුය. කෙටියෙන් සඳහන් කරන්නේ නම්,

1. කේන්ද්‍රයේ 10 නි කොටුව
2. එහි සිටින ග්‍රහයා හෝ ග්‍රහයන්
3. අනෙක් ග්‍රහයන්ට පෙනීම (ශුභ දෘෂ්ඨි)
4. 10 ස්ථානය අධිපති ග්‍රහයා (දසවැන්නාධිපති)
5. 10 අධිපතිට ලැබෙන ග්‍රහ දෘෂ්ඨි (පෙනීම)
6. 10 සමඟ සංයෝග වූ අනෙකුත් ග්‍රහයින්
7. දසවැන්නාධිපති සිටි නවාංශ අධිපතියා

මෙයට අමතරව ග්‍රහ ලෝකයේ කම්කරුවා ලෙස හඳුන්වන සෙනසුරු හා සෙනසුරු පිළිබඳ ඉහත සඳහන් අට වැදැරුම් අයුරින් සොයා බැලීම ඊටත් අමරතව ශ්‍රවණ යෝග ගැන සොයා බැලීම ආදි නොයෙක් කරුණු ගැන සොයා බලා රැකියාව පිළිබඳ නිශ්චිත නිගමනයකට බැසිය යුතුයි.

රැකියාව ගැන බැලීමේදී ඔහුට හෝ ඇයට හිමි රැකියාව කුමක්ද? ගැන බැලීම සඳහා ජ්‍යොතිෂයේ ඉහත සඳහන් කරුණු පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කළ යුතුය. කලින් කලට නොයෙක් අන්දමේ රැකියා ක්ෂෙත්‍රයන් ලෝකයේ ඇතිවේ. එසේ වුවද කාර්මික අංශයේ, සෞන්දර්‍ය අංශය, විද්‍යාත්මක අංශය වශයෙන් සොයා බැලීමට වඩාත් පහසු වේ. ඒ එක් එක් අංශයනට නියෝජනය කරන බලපාන ග්‍රහයින් ග්‍රහ ලෝකයේ ඇති බැවිනි. කලාවට සෞන්දර්යට අධිපති සිකුරු, ඥාණයට, බුද්ධියට අධිපති බුධ, කර්මාන්ත, කාර්මික අංශයට අධිපති ශනි, ජලයට, කෘෂි කර්මාන්තයට අදිපති චන්ද්‍රයා ආදී වශයෙන් සියලුම ග්‍රහයන් මිනිසාගේ වෘත්තීය කෙරෙහි බලපානු ලබයි. අද ලෝකයේ ඊට අමතරව රැකියාව කෙබඳු ආයතනයකද, රජයේද, පෞද්ගලික ආයතනයකද, විදේශයකද, ස්වයං රැකියාවක්වත්ද, දේශපාලන ක්ෂේත්‍රයද ආදී නොයෙකුත් දෑ ගැන සෙවිය යුතුවේ. ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත අපේ පැරණියන් දක්වා ඇත. ජන්ම පත්‍රය අනුව තමා සමත් දෙය හඳුනා ගෙන ඒ ඒ යෙදීමෙන් විශේෂ ප්‍රාගුණ්‍යයකින් රැකියාව කළ හැකි බැව් අත්දැකීම් ඇත. හොඳම වෛද්‍ය යෝගයක් ඇති කෙනෙකු වෙදකම කරන විටත් එවැනි යෝගයක් නැති කෙනෙකු වෙදකම කරන විටත් වෙනස පැහැදිලි වේ. කොතෙක් වෘත්තිකයන් සිටියත් කුසලතා බබලන දක්ෂයින් කී දෙනෙකු ඇත්ද? ඒ ග්‍රහ පිහිටීම අනුවට එවැනි දක්ෂතා ඇති බැව් පෙනී යන කරුණකි. උදාහරණයක් ලෙස චන්ද්‍රයා කන්‍යා රාශියේ උපැත්දී සිටීම හොඳ 11 වැනි යෝගයකි. අත්ගුණය ඇති වෛද්‍ය යෝගයකි. නැත්නම් දක්ෂ බෙහෙත් බඩු වෙළෙන්දෙකි.

10 අධිපතියා කුජ හෝ නවාංශයක පිහිටා කුජ උච්චව ස්වක්ෂෙත්‍ර බලයකත් පිහිටි අය යුද පිටියේ දක්ෂයෝය. එවැනි අය හමුදාපති තනතුරු ලැබුවොත් දක්ෂ ලෙස සිටීම මා අත්දැක ඇති කරුණකි. අනුන් යටතේ රැකියා කළ නොහැකි අයවලුන් කොතෙකුත් ඇත. ඒ අය 10 අධිපති ගුරුගේ නවාංශ සිටින අයවලුන් වෙයි. ඊට අමතරව 10 අධිපති ග්‍රහයා 10 සිටින අය වෙති. ඒ සමගම ර.කු.ගු වැනි ග්‍රහයකු වූ විට වඩාත් ප්‍රබල වෙයි.

සෙනසුරු කම්කරු ග්‍රහයා යැයි ග්‍රහ ලෝකයේ හඳුන්වා ඇති බැව් කලින්ද සඳහන් කළෙමි. ශනි 10 ඇති අයකුට කුමාර ලීලාවෙන් රැකියාව කළ නොහැක. නිතර වැඩකම යෙදීම අවිවේකය, ඇඳුම් කිලිටි කරගෙන හෝ රක්ෂාව කරන්නකු දුටුවොත් ශනි 10 සිටින බැව් හඳුනා ගැනීමට ජන්ම පත්‍රය අවශ්‍යම නැත. ශනි 1 සිටීමද ඒ අයුරින්ම වෙයි. 1 සිටින ශනිට 10 වැන්න පෙනෙන බැවිනි.

මීට අමතරව සෞන්දර්ය අංශයත් ඉහළ තලයට පත්වන ග්‍රහ යෝග ඇත්තේය. ඒ අයුරින්ම කලා ලෝකයේ ජය කෙහෙළි නංවයි. ර.කු.වු.ශ. යෝගය ඇති නිසා අමර දේවයන්ට ඒ තත්ත්වය ලැබුණි. නීති ක්ෂෙත්‍රයට පිවිසි දහස් ගණනක් සිටියත් එයින් දක්ෂතා පෙන්වන්නේ කී දෙනෙකුද. ධනු ලග්නයේ රාහු යෝගය. කු. ගු. යෝගය, ර.ම.කු.ගු ග්‍රහ යෝග ඇති අය එයින් ප්‍රධාන තැනක් ගනී. කොතෙක් ඉහළ රක්ෂාවක් කළත් යම් යම් කාලවල රැකියාවලින් පහළ වැටීම, ඉවත්වීමට සිදුවීම, ආදී අපලද ජන්ම පත්‍රයක ඒ ආකාරයෙන්ම පිහිටා ඇත. සෙනසුරු ඒ රාෂ්ටවලදී රාහුගේ, කේතු අන්තරයද යෙදීමෙන් රැකියා පිළිබඳ කම්කටොලු වලට මුහුණ පාන අවස්ථා කොතෙකුත් මා දැක ඇත. එසේම උපතේදී රැකියා ස්ථානය අධිපති මාරක ස්ථානය අධිපති සමග සිටීනේ රැකියාවේ වරින්වර කරදර ඇතිවීම සාමාන්‍ය සිරිතකි.

ඉහත පරිදි රැකියාවේ යම් යම් කලවලදී ඇතිවන දුර්විපාක ගැන කලින් දැන සිටීමෙන් බලවත් ප්‍රයෝජන අත්වූ අවස්ථා මා අත්දැක ඇත්තෙමි. රැකියා හිරේ විලංගුවේ වැටෙන යෝග රැකියා කරන ග්‍රහයා නිසා ඇති වූ ග්‍රහ තත්ත්වයන් ඇත. 2 අධිපති 12 සිටීම හා 10 වැනි ස්ථානයට ඇති සම්බන්ධය උඩ එසේ සිදුවේ.

එසේම විදේශ රැකියා ලබන යෝග විදේශ ආයතන රැකියා ලබන යෝග ජාත්‍යන්තර රක්ෂාවක් ලබන යෝග ක්ෂේත්‍රවල පිහිටා ඇත. 10 අධිපති 9 සිටීම හෝ 12 වැන්නේ යෙදීම ශනි කටකයේ යෙදීම බොහෝ විට එවැනි අවස්ථාවන්ය. එවැනි යෙදීම ඇති අය උපත් රටේම සිටියත් එම රටේ ඇති විදේශ ආයතනවල රැකියා කරනු ලැබීම මා අත්දැක ඇත.

රැකියා ස්ථානයේ රාහු සිටින අය එක දිගට එකම රක්ෂාවක යෙදී නොසිටීම, දේශපාලනයට පිවිසියත් ජයග්‍රහණ ලැබීම දැකිය හැකිය.

එසේම ගෝචර වශයෙන් රාහු 10 ට පැමිණි විටද රැකියා වෙනස්වීම් හෝ ස්ථාන වෙනස්වීම් මා කොතෙකුත් අත්දැක ඇත.

දරුවකු අධ්‍යාපනය ලබන කාලයේ ඔහුට හෝ ඇයට ගැලපෙන රැකියා ක්ෂේත්‍රය සොයාගෙන ඒ අනුව අධ්‍යාපනය ලබාදීම තුළින් ඵලදායි රැකියා කරන්නන් බිහිකර ගත හැකිය.

ක්ෂෙත්‍රයේ මූලික ඉගැන්වීම වන අඥාණවන්තයා ග්‍රහයින්ට යටත් වේ ඥාණවන්තයා ග්‍රහයින්ගෙන් වැඩ ගනී, යන්න ස්ථාවර වන්නේ එවිටය.

උපතත් තමාට උරුමව ඇති, තමා කැමැති රැකියාවක් ලබා ජීවත්වීම කොතරම් වාසනාවක්ද. 10 වැනි ස්ථානය හතර කේන්ද්‍රයට අයත් ස්ථානයකි. පියා ගැන සඳහන් වන්නේද එම ස්ථානයෙනි. කුඩා කලදි පියා දරුවා රක්ෂණය කරයි. වැඩිහිටි වයසේදී රැකියාව විසින් තමා රක්ෂණය වෙයි. ක්ෂේත්‍රයක ස්ථාන වෙන්කර ඇති ආකාරය කෙතරම් අසිරිමත්ද?

කුඩා කාලයේදී ඉගෙන ගතයුතු කවර අංශයක්ද, තමා යා යුත්තේ කෙබඳු අංශයකටද දැක ඒ පාරේ දරුවා යැවීමට කේන්ද්‍රයෙන් වැඩ ගැනීමකි. ඥාණවන්තයා ග්‍රහයින්ගෙන් වැඩ ගන්නේ එවිටයි. ඔබ දැනට කරන රැකියාව අසහනයෙන්ද? හිමි රක්ෂාව හෝ ව්‍යාපාරය ගැන ජන්ම පතින් සොයාගෙන ව්‍යාපාරයක් කුඩාවට හෝ ආරම්භ කර බලන්න. ඔබට ව්‍යාපාර නොගැලපෙන්නෙකු නම් ව්‍යාපාර වලින් මිදී රක්ෂාවක් සොයා ගන්න. ජීවිතයේ සහනය ඇත්තේ එතැනයි.

**සෝමා කලුපහන රාජපක්ෂ**
(හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ)
B.A. SLES Classi


# කුරුළු පිහාටු

සුමිත් කුමාර අධ්‍යක්ෂණ කළ
ජැක්සන් ඇන්තනි සපිත් අනුත්තර
හේමසිරි ලියනගේ දිල්හානි ඒකනායක
රඟපාන

## කුරුළු පිහාටු

චිත්‍රපටය

**ඩැන්ඩිනොන් ධම්මදීප භාවණා මධ්‍යස්ථානයට අධාර පිණිස**
පූනි මස 3 වන ඉරු දින
සවස 2.30 සහ 5.30 ට
වේවලි ගාඩින් සිනමා සංකීර්ණයේ දී ද

**සෙන්ට් ඕල්බන්ස් පාරමිතා බෞද්ධ විහාරයට ආධාර පිණිස**
ජූනි 10 වන ඉරු දින සවස 5.30 ට
එපින් රීඩින් සිනමා හලේදී ද
ප්‍රදර්ශණය කෙරෙයි.


# Udurawana

**Udurawana -**
why r all these people running?

**Man-**
This is a race, the winner will get the cup.

**Udurawana**
-If only the winner will get the cup, why others running?

0000000

**Teacher:**
"I killed a person" convert this sentence into future tense.

**Udurawana:**
The future tense is "u will go to jail".

00000000

**Udurawana told his servant:**
Go and water the plants.

**Servant:** It's already raining.

**Udurawana:** So what? Take an umbrella and go.

00000000

It was the first time that Udurawana got into an aero plane so, he got in, took a seat near a window and was looking out side very keenly.

The passenger seated next to him was a bit curious.

"Excuse me" he inquired to Udurawana "What do you see outside ?

"We must be high above ground now" said Udurawana' people on the ground look like ants from here.

"That's interesting ! said the other passenger, and looked through the window. Then, smiling he said,

"They really ARE ants. You know, the plane is yet to take off !

0000000

Udurawana, though a strong Buddhist, enjoyed reading the Bible immensely. One day, after reading the bible, our good friend was visibly upset and this was noticed by his wife too. She was curious to know as to what had made her so upset.

After wiping his tears,Udurawa explained to his wife the cause of his grief. "see dear....I never expected the end of such a noble personality to be so tragic and miserable. Do you know that he died in a gunny bag?" Mrs Udurawana, the better educated of the two knew that her husband has blundered somwhere again.

She grabbed the the bible from her husband and began to read it. To her amusement, she found the last sentence therein which read as ".........Thus the Jesus Christ died in agony."
Our good friend had read it as "Thus the Jesus Christ died in a gony" (Gony in Sinhala means gunny bag).

000000

Seeing Udurawana jump off the plane, a worker in the airport came running for help.

"Are you hurt?", he asked, helping Udurawanna to stand up.

"No, I am not Hurt. I am Udurawana" was the reply.